**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2021**

**------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එන ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.1,843,950 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය පවත්වා තිබුණු පාඨමාලා වෙනුවෙන් රු.3,577,394 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද එම ප්‍රමාණය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණු අතර මෙම ලැබිය යුතු ශේෂය අයකර ගැනීම මතභේදයට තුඩු දී තිබුණි. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් අදාළ මුදල ප්‍රතිපූර්ණය සඳහා අවශ්‍ය කටයුතු වෙනුවෙන් නියෝජිත නිලධාරිවරයෙකු පැමිණ උදූනේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර ලබා දෙන වාර්තාවට අනුව එම වියදම් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරන බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අප වෙත දැනුම් දී ඇත. | අයකර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය පිරිවැය එකතු කිරීම්, ඉවත් කිරීම් ප්‍රත්‍යාගණන වටිනාකම සහ ක්ෂය දැක්වෙන පරිදි විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ එකතු කිරීම්, ඉවත් කිරීම්, ප්‍රත්‍යාගණන වටිනාකම සහ ක්ෂය දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇත. | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව 1995 ජුලි 28 දිනැති අංක 882 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ 5(3) වගන්තිය | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ උපදෙස් සැපයීම සිදුකළ යුතු වුවත් එම කටයුතු සිදුකර නොතිබුණි. | කර්මාන්තය වෙනුවෙන් යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අවශ්‍ය වන කාර්ය මණ්ඩලය හා තාක්ෂණ යටිතල පහසුකම් ලබාගැනීම වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමේ හිඟතාවය මත පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය, ජාතික ව්‍යවසායක සංවර්ධන අධිකාරිය, පරමාණුක බලශක්ති අධිකාරිය මෙන්ම Gemmological Institute Of Thailand වැනි ආයතන සමඟ සංධීය වැඩ සටහන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක වේ. | අතිවිශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,105,126 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.6,339,649 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,444,775 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් පාඨමාලා ආදායම් පහළ යාම හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ උනන්දුවන පාර්ශවයන් වෙත සේවාවන් 16 සැපයිමට සැලසුම් කර තිබුණත් එක් සේවාවන් පමණක් සපයා තිබුණි. | කර්මාන්තයෙන් ලැබෙන ඉල්ලීම් අනුව මෙම ගෙවුඩ තාප පිරියම් සේවාව ලබා දෙන අතර ඒ අනුව ලද එකම ඉල්ලීම වෙනුවෙන් සේවාව ලබා දී ඇත .කෙසේ නමුත් අප ආයතනය මගින් පවත්වනු ලබන තාප පිරියම් කිරීමේ පාඨමාලාව හරහා බිහි කර ඇති ව්‍යවසායකයින් තමන් විසින්ම තම මැණික් සාම්පල තාප පිරියම් කර ගනු ලබන අතර එම සේවාවන්ද කර්මාන්තයට ලබා දෙනු ලබයි .එම හේතුවෙන් විශේෂිත අවස්ථා සඳහා පමණක් අප ආයතනයෙන් සේවාව ලබා ගැනීමට යොමු වී ඇත. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු.10,977,344 කට මිලදී ගත් විදුලි උදුනක් මිලදී ගෙන වර්ෂ 6 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2020-2021 කාලය තුල රු.3,953,540 ක මුදලක් දරා මෙම උදුන අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා වැඩි දියුණු කිරීම් කර තිබුණි. 2020-2021 කාලය තුල දින 14 ක කාලයක් තුල පර්යේෂණ ධාවන වාර 05 කට පමණක් යන්ත්‍රය භාවිතා කර තිබුණි. | 2020 පෙබරවාරි 11 වන දින උදුන මහජන සේවයෙහි යෙදවීම සඳහා පවත්වන ලද සමාරම්භක උත්සවයෙන් පසුව 2020 පෙබරවාරි 26 දින සිට දින 06 ක් දක්වා පර්යේෂණ ධාවන වාරයක් සිදු කරන ලදී. ඉන් පසුව රට තුල ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අවහිරතා මත නැවත ධාවන වාරයක් සිදු කරන ලද්දේ 2020 දෙසැම්බර් 08 දින සිටය. නමුත් පසු දින උදුනේ ඇති පාලක පරිපථයෙහි ඇති වූ දෝෂයක් හේතුවෙන් එම ධාවන වාරය අත්හිටුවීමට සිදු විය. මේ පිළිබඳව නියෝජිත ආයතනය දැනුවත් කිරිමෙන් අනුතුරුව ඒ සඳහා අවශ්‍ය | ආයතනය විසින් මේ සඳහා අධික වියදමක් දරා ඇති නිසා ඵලදායි හා කාර්යක්ෂම ලෙස මෙම යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ඉලෙක්ට්‍රොනික උපාංග විදේශීය මව් ආයතනයෙන් ගෙන්වා අලුත්වැඩියාව සිදු කරන ලදී. නමුත් ඒ සඳහා මාස 04 කට අධික කාලයක් ගත වී ඇත. ඒ අනුව 2020-2022 කාලය තුල ඇති වූ ඉහත අවහිරතා මධ්‍යයේ සමස්ථ වශයෙන් දින 20 ක් විදුලි උඳුන ධාවනය කර ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017-2031 කාලය තුල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 300.65 කින් කරගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය මඟින්, මොණරාගල, බදුල්ල, මාතලේ, රත්නපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50 ක මැණික් නිධි ගවේෂණය සිදුකර වාර්තා සහ සිතියම් නිකුත් කිරීමට සැලසුම් කල දිස්ත්‍රික්ක 04 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ගවේශණ කටයුතු කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක පමණක් අවසාන වාර්තා සහ සිතියම් නිකුත් කර තිබුණි. | කාර්ය මණ්ඩලය ලැබෙන තුරු ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලයෙන් ව්‍යාපෘති කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලය අනුව සැලකීමේ දී විගණනයෙන් දක්වා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණද එම සඳහන් කර ඇති ප්‍රගතිය වුවද අත්කර ගෙන ඇත්තේ මෙම දැනට සිටින සීමිත භූ විද්‍යා හා ඛනිජ විද්‍යා උපාධිධාරීන් ගණන වන නිලධාරින් 3 දෙනෙකුගේ සහ දැනට සේවය හැර ගොස් සිටින තවත් නිලධාරින් සිව්දෙනෙකුගේ දායකත්වයෙනි. මේ වන විට ව්‍යාපෘතියට සක්‍රියව දායක වනුයේ නිලධාරින් තිදෙනෙක් පමණි. කාර්ය මණ්ඩල හිඟතාව සහ මෙරට මැණික් නිධි වල ව්‍යාප්තිය හා බැඳුණු විද්‍යාත්මක හා ප්‍රායෝගික හේතූන් මත පදනම්ව, සිටින අවම කාර්ය මණ්ඩලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම පිණිස මෙම ව්‍යාපෘතිය හඳුනාගත් ප්‍රමුඛතා ලැයිස්තුවකට අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් සිදු කරනු ලබන බව සඳහන් කරමු. | අධිකාරියේ මෙහෙයුම් කාර්යක්ෂමතාව හා ඵලදායිව ඉටු කර ගත හැකි ආකාරයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේ සිට මේ දක්වා මැණික් ඇති බවට හඳුනාගෙන ඇති ඉඩම් 112 ක විස්තර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ලබාදී තිබුණත් මෙම ඉඩම් වෙන්දේසි කිරීම සඳහා යොමු වී නොතිබුණි. ආයතනය විසින් මැණික් ඇති බවට හඳුනාගෙන ඇති ඉඩම්වල මැණික් නැවත තිබේදැයි පරීක්ෂා කිරීමට පර්යේෂණ පතල් කැණීම් සිදුකළ යුතු බවට අධිකාරිය තීරණය කිරීමත් ආයතන 2 ක අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිව පර්යේෂණ සිදුකිරීම නිසා දැනට සිදුකරන පර්යේෂණ වල ඵලදායිතාවක් ඇතිවී නොතිබුණි. | මේ වන විට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලබා දී ඇති තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉඩම් හිමියන් එම අධිකාරිය විසින් තවලම ප්‍රාදේශීය කාර්යාලය වෙත කැඳවා ඇති අතර ඒ අනුව එම ඉඩම් හිමියන් වෙත මැණික් කැනීම් බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බවට අප දැනුවත් කර ඇත. | ආයතන 2 අතර මනා සම්බන්ධීකරණයෙන් යුතුව පර්යේෂණවල ප්‍රතිඵල ඵලදායී ලෙස යොදා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මැණික් ඇති බවට හඳුනාගන්නා ලද ඉඩම් ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරියට යොමුකර ඒවා වෙන්දේසි කිරීමෙන් ලැබෙන ආදායමින් සියයට 25 ක් ආයතනය වෙත ලබාගෙන එම මුදලින් රු.මිලියන 174.15 ක් 2022-2031 අතර කාලයේ ව්‍යාපෘතියට යොදවීමට බලාපොරොත්තු වුවත් එම මුදල ලබා ගෙන ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | ව්‍යාපෘතිය හරහා හඳුනාගෙන ඇති සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ පවතින සියළුම සුදුසු මැණික් විභව ඉඩම් පතල් කැනීම් සඳහා යොමු කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය එකඟවී ඇත. ඒ හරහා අපේක්ෂිත ආදායම මෙම ආයතනය වෙත ලබා ගැනීමට අපේක්ෂාවෙන් ඇත. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එකඟතාවයකට පැමිණ ව්‍යාපෘතිය ඉදිරියට ඵලදායිව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | අධ්‍යාපන අමාත්‍යාංශය හා ආයතනය අතර 2019 වර්ෂයේ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමක් අනුව “13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන” යටතේ මැණික් කැපීම හා ඔප මට්ටම් කිරීම හා ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා ආයතනය විසින් පාසැල් සිසුන්ට පුහුණුව ලබා දෙමින් පැවතුණි. 2019-2021 කාලය තුල මැණික් කැපීම සහ ඔප දැමීම සඳහා සිසුන් 185 ක්ද ස්වර්ණාභරණ | 2019 – 2021 කාලය තුල රට තුල පැවති අනපේක්ෂිත තත්ත්වය අනුව එනම් පාස්කු ප්‍රහාරය සහ කොරෝනා වසංගතය හේතුවෙන් වැඩි කාල සීමාවක් රට වසා දැමීමට කටයුතු කිරීමට සිදු වීම මත මෙම කාල සීමාවේදි ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර පැවති බොහෝ පුහුණු පාඨමාලා විධිමත් අයුරින් එම අපේක්ෂිත කාල සීමාවේදිම අවසන් කිරීමට නොහැකි වූ අතර පාඨමාලා කාලය සාමාන්‍ය තත්ත්වයට | ආයතනයේ අරමුණු ඉටු කර ගැනිම සඳහා පුහුණු පාඨමාලා විධිමත් පරිදි සැලසුම් කර ක්‍රියාක්මක කළ යුතුය. |

| | |
|---|---|
| නිෂ්පාදන පාඨමාලාව සඳහා සිසුන් 227 දෙනෙකු ද යොමු කර තිබුණත් මේ සඳහා ආයතනයේ පුහුණුව ලබා ගෙන තිබුණේ පිළිවෙලින් සිසුන් 96 සහ 151 ක් පමණි. | වඩා දිර්ඝ වීමක් සිදු විය. ඒ අනුව ක්‍රියාත්මක වූ එම පාඨමාලා අවසන් කිරීමකින් තොරවම අලුතින් සිසුන් බඳවා ගනිමින් නව පාඨමාලා ආරම්භ කිරීමට ආයතනික භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් මට්ටමින් නොමැති නිසා දහතුන් වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ අමාත්‍යාංශයෙන් යොමු කරන ලද සිසුන් අදාල කාල සීමාව තුලදීම බඳවා ගැනිමට නොහැකි විය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ අර්ධ මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරිම් ක්‍රම හඳුන්වා දීම සඳහා සිදුකල ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 21 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදි මිලදි ගත යුතුවූ Pressure Vessel උපකරණයක් ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන මත රු.999,895 ක මුදලකට ව්‍යාපෘතිය අවසන් විමෙන් පසු එනම්, 2021 අප්‍රේල් 29 දින මිලදි ගැනිමට කටයුතු කර තිබුණි. | ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ අදාල කාල සීමාව තුල මෙම උපකරණය මිලදී ගැනීමට කිහිප වතාවක්ම මිල ගණන් කැඳවූව ද සුදුසු Preshure Vesseal උපකරණ සඳහා ටෙන්ඩර් පත් නොලැබුන නමුත් ව්‍යාපෘතිය අවසාන භාගයේ සිදු කරන ලද මිල ගණන් කැඳවීමේදී අපේක්ෂිත එම උපකරණය සඳහා මිල ගණන් ලබා ගන්නා ලදී. ඒ අනුව අදාල උපකරණය ඇණවුම් කල අතර උපකරණය ලැබීමට යම් කාලයක් ගත වීම නිසා එම ප්‍රමාදය සිදු වී ඇත. මේ පිළිබඳව ජාතික විද්‍යා පදනම දැනුවත් කර ඇති අතර එම උපකරණය දැනටත් වෙනත් පර්යේෂණ කටයුතු වෙනුවෙන් භාවිතයේ යොදවයි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නියමිත කාලය තුල ප්‍රසම්පාදනයන් සිදුකල යුතුය. |